# Sri Lanka State Plantations Corporation

## STATEMENT OF FINANCIAL POSITION

| In LKR.<br>As at 31st December | Notes | 2018 | 2017 |
|---|---|---|---|
| **ASSETS** | | | |
| **Non-Current Assets** | | | |
| Property, Plant and Equipment | 8 | 756,206,267 | 750,687,203 |
| Biological Assets | 9 | 3,466,853,617 | 3,459,074,142 |
| Investment Property | 10 | 1,611,520,641 | 1,611,520,641 |
| Fixed Deposits | | 8,532,777 | 8,188,992 |
| Capital Work in Progress | | - | 335,347 |
| Deferred Assets | | 781,064 | 1,128,930 |
| **Total Non-current Assets** | | **5,843,894,366** | **5,830,935,254** |
| **Current Assets** | | | |
| Inventories | 11 | 48,241,155 | 25,182,454 |
| Trade and Other Receivables | 12 | 115,551,243 | 106,392,662 |
| Other Deposits | 13 | - | 1,935,020 |
| Cash and Cash Equivalents | 14 | 53,812,300 | 101,871,142 |
| **Total Current Assets** | | **217,604,698** | **235,381,278** |
| **Total Assets** | | **6,061,499,064** | **6,066,316,532** |
| **EQUITY AND LIABILITIES** | | | |
| **Capital and Reserves** | | | |
| Contributed Capital | 15 | 5,657,852,850 | 5,499,852,851 |
| Retained Earnings | | (1,067,273,122) | (918,393,477) |
| **Total equity** | | **4,590,579,728** | **4,581,459,374** |
| **Non-current liabilities** | | | |
| Employee Benefit Obligations | 16 | 339,598,126 | 352,203,370 |
| **Total Non-current liabilities** | | **339,598,126** | **352,203,370** |
| **Current liabilities** | | | |
| Trade and Other Payables | 17 | 1,091,072,027 | 1,126,997,896 |
| Bank Overdraft | | 40,249,182 | 5,655,892 |
| **Total Current liabilities** | | **1,131,321,209** | **1,132,653,788** |
| **Total liabilities** | | **1,470,919,336** | **1,484,857,158** |
| **Total equity and liabilities** | | **6,061,499,063** | **6,066,316,532** |

AUDITED

The accounting policies and notes on pages 5 through 19 form an integral part of the financial statements.

The undersigned certify that these financial statements are prepared in accordance with Sri Lanka Accounting standards Sri Lanka.

**Mr. S.I.M.Hassan**
*Deputy General Manager - Finance*

**Mr. R.G.H.S.Gunathilake**
*Accountant*

The Board of Directors is responsible for the preparation and presentation of these Financial Statements. Approved and signed for and on behalf of Board of Directors of Sri Lanka State Plantations Corporation by,

**Mr. Srimal Wijesekara**
Chairman/CEO

**Mr. S.M.C.S.Siriwardena**
Board Member

**Mr. D.R.S.Senarathne**
Board Member

***22th May 2020, Colombo.***

# Sri Lanka State Plantations Corporation

## STATEMENT OF INCOME

| In LKR.<br>Year ended 31st December | Notes | 2018 | 2017 |
|---|---|---|---|
| **Revenue** | 18 | **597,950,423** | **662,528,772** |
| Cost of Sales | 20 | (720,501,111) | (739,478,400) |
| **Gross Profit / (Loss)** | | **(122,550,687)** | **(76,949,628)** |
| Other Income | 19 | 115,508,842 | 102,628,358 |
| Administrative Expenses | 21 | (128,666,247) | (112,737,334) |
| **Operating Profit / (Loss)** | | **(135,708,092)** | **(87,058,604)** |
| Finance Expenses | 22 | (12,090,415) | (7,873,996) |
| **Profit/ (Loss) for the Period** | | **(147,798,507)** | **(94,932,600)** |

The accounting policies and notes on pages 5 through 19 form an integral part of the financial statements.

AUDITED

## Sri Lanka State Plantations Corporation

**STATEMENT OF CHANGES IN EQUITY** **In LKR.**

| **Year ended 31 December 2018** | **Capital** | **Land Contribution** | **Accumulated Profit/(Loss)** | **Total** |
|---|---|---|---|---|
| | **Rs.** | **Rs.** | **Rs.** | **Rs.** |
| **Balance as at 01 January 2017** | 3,015,250,925 | 2,220,601,926 | (755,362,392) | 4,480,490,459 |
| Grants Received from Treasury | 264,000,000 | - | - | 264,000,000 |
| Loss for the year | - | - | (94,932,600) | (94,932,600) |
| Prior year adjustments (Note 26) | - | - | (68,098,890) | (68,098,890) |
| **Balance as at 31 December 2017** | **3,279,250,925** | **2,220,601,926** | **(918,393,882)** | **4,581,458,969** |
| **Balance as at 01 January 2018** | 3,279,250,925 | 2,220,601,926 | (918,393,477) | 4,581,459,374 |
| Grants Received from Treasury | 158,000,000 | - | - | 158,000,000 |
| Loss for the year | - | - | (147,798,507) | (147,798,507) |
| Prior year adjustments (Note 26) | - | - | (1,081,138) | (1,081,138) |
| **Balance as at 31 December 2018** | **3,437,250,925** | **2,220,601,926** | **(1,067,273,122)** | **4,590,579,729** |

The accounting policies and notes on pages 5 through 19 form an integral part of the financial statements.

AUDITED

# Sri Lanka State Plantations Corporation

## STATEMENT OF CASH FLOWS

**In LKR.**

| **Year ended 31st December** | **Notes** | **2018** | **2017** |
|---|---|---|---|
| **Cash Flows from Operating Activities** | | | |
| Net Profit /(Loss) Before Taxation | | **(147,798,507)** | **(94,932,600)** |
| **Adjustments for :** | | | |
| Depreciation of Biological Assets | 9.2 | 3,333,614 | 3,185,380 |
| Depreciation of Assets | 8 | 8,453,297 | 7,969,478 |
| Road Rehabilitation Fund | | - | 148,078 |
| Finance Expense | 21 | 12,090,415 | 7,873,996 |
| Gratuity Provision | 16 | 25,853,232 | 36,159,924 |
| Loan Interest | | (1,600,000) | (1,600,000) |
| Audit fee Provisions | | 208,000 | 534,630 |
| Insurance Provision | | 204,055 | 532,134 |
| Management Fee Expenses | | - | (172,409) |
| Over Provision of Holiday Pay | | - | 9,353,603 |
| Prior year adjustments | 26 | (1,240,487) | (69,698,890) |
| Identified Diffrence | | | - |
| **Profit before Working Capital Changes** | | **(100,496,382)** | **(97,446,676)** |
| **Changes in Working Capital** | | | |
| (Increase) / Decrease in Inventories | | (23,058,701) | 26,416,546 |
| (Increase) / Decrease in Trade and Other Receivables | | (9,158,581) | 3,341,753 |
| (Increase) / Decrease in Other Deposits | | 1,935,020 | 10,000 |
| Increase / (Decrease) in Current Liabilities | | (65,771,625) | (112,806,584) |
| **Cash generated from operations** | | **(96,053,887)** | **(180,484,962)** |
| **TRADE AND OTHER RECEIVABLES** | | | |
| Gratuity Paid | | (9,024,774) | (43,727,764) |
| Finance Cost Paid | | (10,490,415) | (6,273,996) |
| Treasury Grants Received | | 158,000,000 | 264,000,000 |
| **Net cash generated from operating Activities** | | **138,484,811** | **33,513,278** |
| **Cash flows from Investing Activities** | | | |
| Additions to Property, Plant and Equipment | 8 | (13,913,013) | (13,935,310) |
| Additions to Biological Assets | 9.2 | (11,013,089) | (10,363,351) |
| Deferred Assets | | 347,867 | - |
| Investment in capital WIP | | 335,347 | (256,690) |
| Investment in FDs | | (343,785) | (757,992) |
| **Net cash Used in Investing Activities** | | **(24,586,674)** | **(25,313,343)** |
| **Increase / (Decrease) in Cash and Cash Equivalents** | | **(82,652,131)** | **8,199,935** |
| **Movement in cash and cash equivalents** | | | |
| At the beginning of the period | | 96,215,249 | 88,015,314 |
| Increase/(Decrease) for the year | | (82,652,131) | 8,199,935 |
| **Cash & Cash Equivalents at end of the year** | | **13,563,118** | **96,215,249** |

AUDITED

## Sri Lanka State Plantations Corporation

### NOTES TO THE FINANCIAL STATEMENTS

### 8 PROPERTY, PLANT AND EQUIPMENT

| Head office | Freehold land | Buildings | Equipment | Furniture | Motor Vehicles | Computer | Total |
|---|---|---|---|---|---|---|---|
| **Cost or Valuation** | | | | | | | |
| **At 1st January 2018** | **4,031,845** | **4,959,427** | **10,935,726** | **2,456,911** | **66,115,401** | **3,054,875** | **91,554,185** |
| Additions | - | - | 800,240 | 2,508,875 | - | 887,835 | 4,196,950 |
| Disposals | - | - | - | - | - | - | - |
| **At 31st December 2018** | **4,031,845** | **4,959,427** | **11,735,966** | **4,965,787** | **66,115,401** | **3,942,710** | **95,751,135** |
| **Depreciation** | | | | | | | |
| **At 1st January 2018** | - | **4,959,384** | **9,853,234** | **1,981,802** | **66,094,153** | **2,674,122** | **85,562,695** |
| Depreciation Charge for the year | - | - | 215,320 | 303,966 | - | 298,948 | 818,234 |
| Disposals | - | - | - | - | - | - | - |
| **At 31st December 2018** | **-** | **4,959,384** | **10,068,554** | **2,285,768** | **66,094,153** | **2,973,070** | **86,380,929** |
| **Net book value** | | | | | | | |
| **At 31st December 2018** | **4,031,845** | **43** | **1,667,412** | **2,680,018** | **21,247** | **969,640** | **9,370,206** |

| Estates | Lands | Buildings | Equipment, Furniture & Fittings | Motor Vehicles | Other Vested Assets | Machinery | Total |
|---|---|---|---|---|---|---|---|
| **Cost or Valuation** | | | | | | | |
| **At 1st January 2018** | **645,345,972** | **162,771,551** | **24,134,486** | **79,919,892** | **6,672,973** | **115,713,335** | **1,034,558,209** |
| Additions | - | 7,277,474 | 301,732 | 832,800 | - | 1,304,057 | 9,716,063 |
| **At 31st December 2018** | **645,345,972** | **170,049,025** | **24,436,218** | **80,752,692** | **6,672,973** | **117,017,392** | **1,044,274,272** |
| **Depreciation and Impairment** | | | | | | | |
| **At 1st January 2018** | - | **100,892,582** | **18,060,179** | **67,361,193** | **6,672,972** | **96,875,570** | **289,862,495** |
| Depreciation Charge for the year | - | 3,941,872 | 587,722 | 2,347,967 | - | 757,502 | 7,635,063 |
| **At 31st December 2018** | **-** | **104,834,455** | **18,647,901** | **69,709,160** | **6,672,972** | **97,633,072** | **297,438,210** |
| **Net book value** | | | | | | | |
| **At 31st December 2018** | **645,345,972** | **65,214,570** | **5,788,317** | **11,043,532** | **1** | **19,384,321** | **746,836,061** |
| **Net book value Head office and Estate At 31st December 2018 (Head office and Estates Total)** | **649,377,816** | **65,214,613** | **7,455,729** | **13,723,551** | **21,248** | **20,353,961** | **756,206,267** |

AUDITED

## 9 BIOLOGICAL ASSETS

### 9.1 Consumable Biological Assets

| | As at 31.12.2018 Rs. | As at 31.12.2017 Rs. |
|---|---|---|
| **Timber** | 3,314,581,133 | 3,312,160,200 |

No valuation done during the year 2018 since some of this timber areas falling under Knuckles Conservation range and demarcation by Forest department is not completed. Also the valuation will huge cash outflow and due to the prevailing tight cash flow situation SLSPC is not in a position to incur these costs at this time.

### 9.2 Bearer Biological Assets

Bearer biological assets would be carried at cost less any accumulated depreciation.

| Cost | Tea | Coconut | Pepper | Rubber | Coffee | Other | Reforestation | Total |
|---|---|---|---|---|---|---|---|---|
| **Cost or valuation** | | | | | | | | |
| **As at 1st January 2018** | **464,757,498** | **3,588,367** | **2,867,652** | **15,270,484** | **1,501,242** | **3,893,376** | **23,191,779** | **514,970,398** |
| Additions | 6,095,322 | 220,840 | 370,566 | - | - | 591,779 | 1,313,649 | **8,592,156** |
| Previous year adjustment | | | | | | | | - |
| Transfer | | | | | | | | - |
| Disposals | | | | | | | | - |
| **As at 31st December 2018** | **470,852,820** | **3,809,207** | **3,238,219** | **15,270,484** | **1,501,242** | **4,485,155** | **24,505,428** | **523,662,555** |
| | | | | | | | | - |
| **Depreciation** | **357,072,493** | **2,646,007** | **1,921,548** | **2,744,531** | **1,406,674** | **610,916** | **1,654,287** | **368,056,457** |
| **At 1st January 2018** | | | | | | | | - |
| Depreciation Charge for the Year | 1,984,601 | 22,931 | 112,569 | 374,806 | 5,114 | 136,273 | 698,603 | 3,333,614 |
| Previous year adjustment | - | - | - | - | - | 1,283 | - | 1,283 |
| Disposals | - | - | - | - | - | - | - | - |
| **As at 31st December 2018** | **359,057,094** | **2,668,938** | **2,034,117** | **3,119,337** | **1,411,788** | **745,906** | **2,352,890** | **371,390,070** |
| | | | | | | | | |
| **Net book value** | | | | | | | | |
| **As at 31st December 2018** | **111,795,726** | **1,140,269** | **1,204,102** | **12,151,147** | **89,454** | **3,739,249** | **22,152,538** | **152,272,484** |
| | | | | | | | | |
| **TOTAL BIOLOGICAL ASSETS (Note 9.1 + 9.2)** | **111,795,726** | **1,140,269** | **1,204,102** | **12,151,147** | **89,454** | **3,739,249** | **22,152,538** | **3,466,853,617** |

AUDITED

| **10** | **INVESTMENT PROPERTY** | **As at 31.12.2018 Rs.** | **As at 31.12.2017 Rs.** |
|---|---|---|---|
| | Land Contribution from Government | 1,600,601,926 | 1,600,601,926 |
| | Land for Capital Appreciation | 10,918,715 | 10,918,715 |
| | | **1,611,520,641** | **1,611,520,641** |

According to the Gazette number 181/12 dated 27th February 1982, the ownership of some estates was vested to Sri Lanka State Plantations Corporation by the Government of Sri Lanka. These were handed over to nineteen (19) regional Plantation Companies (RPCs) in 1992 on long term lease. Management is of the view that the cost of such land as of the date these lands were handed over to the RPCs reflects reasonably the cost of land and such amounts are carried forward in the books.

As per LKAS 40, an investment property shall be measured initially (at the point of transfer) at its cost and subsequently using either the fair value model or the cost model. At the time of converting to SLFRS the Management was not in a position to get the monitory values as at the date of transfer and instead the values as at handing over the lands to RPCs were considered to be the fair value of the estates. Therefore the land value was extracted proportionately from the balance sheets of RPCs as at 1992.

These Investment properties were not valued, since valuation will require large sum of money and the present cash flow situation of SLSPC does not allow a huge expenditure of this nature at a time where even the large amounts of statutory dues are not being settled to date.

AUDITED

| **11** | **INVENTORIES** | **As at 31.12.2018 Rs.** | **As at 31.12.2017 Rs.** |
|---|---|---|---|
| | Finished Product | 38,764,682 | 14,018,305 |
| | Consumable Stock | 9,476,474 | 11,164,149 |
| | | **48,241,155** | **25,182,454** |

Inventory value was calculated after considering the lower of Cost and the Net Realizable Value (NRV).

| **12** | **TRADE AND OTHER RECEIVABLES** | **As at 31.12.2018 Rs.** | **As at 31.12.2017 Rs.** |
|---|---|---|---|
| | Trade Debtors - Head office (a) | 49,756,365 | 50,580,280 |
| | **Less :** Specific Impairment of Head office debtors | (15,404,568) | (15,404,568) |
| | Trade Debtors - All Estates (b) | 64,303,903 | 59,426,206 |
| | **Less :** Specific Impairment of estate debtors | (49,128,420) | (49,128,420) |
| | Other Receivables - Head office | 21,822,783 | 17,901,856 |
| | Other Receivables - All Estates | 44,201,179 | 43,017,308 |
| | | **115,551,243** | **106,392,662** |
| **a).** | **Trade Debtors - Head office includes the following** | | |
| | B.C.C. Company | 15,404,568 | 15,404,568 |
| | Less : Specific Impairment of Head office debtors | (15,404,568) | (15,404,568) |
| | Receivables from Green Leaf Buyers | 25,899,588 | 27,721,676 |
| | Elkaduwa Plantation | 1,916,092 | 1,916,092 |
| | Woodside Estate | 992,125 | 992,125 |
| | Dukwarie | 2,500,000 | 2,500,000 |
| | Sundry and Other Debtors | 3,043,992 | 1,673,292 |
| | | **34,351,797** | **34,803,185** |
| **b).** | **Trade Debtors - Estates includes the following** | | |
| | Sundry Debtors | 7,754,648 | 6,350,718 |
| | Consumer debtors | 41,071,407 | 41,071,407 |
| | Sundry Income Debtors | 2,588,530 | 2,588,530 |
| | J.E.D.B | 1,668,269 | 1,668,269 |
| | Debtors for Produce | 752,520 | 752,520 |
| | Less : Specific Impairment of estate debtors | (47,537,070) | (47,537,070) |
| | Less : Provision for Bad Debts | (1,591,349) | (1,591,349) |
| | Interplantation Current Account | 1,930,180 | 1,930,180 |
| | Other Debtors | 8,538,349 | 5,064,582 |
| | | **15,175,484** | **10,297,786** |

AUDITED

| | | As at 31.12.2018 Rs. | As at 31.12.2017 Rs. |
|---|---|---|---|
| **13** | **OTHER DEPOSITS** | | |
| | Deposits and Advances | - | 2,087,520 |
| | | **-** | **2,087,520** |

| | | As at 31.12.2018 Rs. | As at 31.12.2017 Rs. |
|---|---|---|---|
| **14** | **CASH AND CASH EQUIVALANTS** | | |
| | **Favourable balances :** | | |
| | Cash in hand and at bank | | |
| | - Head Office | 52,932,601 | 89,444,649 |
| | - Estates | 879,699 | 10,202,389 |
| | | **53,812,300** | **99,647,037** |

| | | As at 31.12.2018 Rs. | As at 31.12.2017 Rs. |
|---|---|---|---|
| **15** | **CONTRIBUTED CAPITAL** | | |
| | Government Contribution | 3,041,262,947 | 3,279,250,925 |
| | Land Contribution from Government | 2,616,589,903 | 2,220,601,926 |
| | | **5,657,852,850** | **5,499,852,851** |

Total Government contribution consists of cash received from government(Treasury) and the lands transferred to Sri Lanka State Plantations Corporation by the government through gazette notifications. During the year Under review treasury grants of Rs. 90 Million received towards the settlement of long outstanding statutory dues and Rs. 68 Million was received for operational expenditures of the SLSPC.

| | | As at 31.12.2018 Rs. | As at 31.12.2017 Rs. |
|---|---|---|---|
| **16** | **EMPLOYEE BENEFIT OBLIGATIONS** | | |
| | Opening Balance - Estates | 337,135,449 | 331,230,311 |
| | - Head office | 15,067,921 | 14,813,144 |
| | Gratuity Adjustment | | |
| | Provision for the Year | 25,853,232 | 27,819,035 |
| | Under Provision / Overprovision Adjustment (Estates & H. | (10,612,275) | 8,340,889 |
| | Transferred to Gratuity Payable | (17,658,276) | (23,880,447) |
| | Payment During the Year | (9,024,774) | (2,894,191) |
| | Other Transaction | (1,163,150) | (3,225,371) |
| | | **339,598,126** | **352,203,370** |

## 17 TRADE AND OTHER PAYABLES

| | | As at 31.12.2018 | As at 31.12.2017 |
|---|---|---|---|
| | | Rs. | Rs. |
| Head office | **(a)** | 277,029,870 | 263,406,193 |
| Estates | **(b)** | 812,109,113 | 861,658,660 |
| Non Operative Balance | | 1,933,044 | 1,933,044 |
| | | **1,091,072,027** | **1,126,997,896** |

**a). Trade and other payables for Head office includes the following**

| | As at 31.12.2018 | As at 31.12.2017 |
|---|---|---|
| Advance - Opalgala ( Lease Advance ) | 4,480,000 | 4,480,000 |
| Timber Advance | 786,379 | 786,379 |
| Poly Chemix | 715,389 | 715,388 |
| Perth Estate | 6,932,399 | 6,985,532 |
| Janatha Estates Development Board (JEDB) | 97,709,342 | 97,709,342 |
| Brokers - LCBL & CTB | 8,968,682 | 9,454,115 |
| Advance Received - Green Leaf Buyers | 15,369,689 | 3,582,524 |
| State Resources Management Corporation | 28,709,029 | 28,709,029 |
| Fertilizer Corporation | 35,931,679 | 35,931,679 |
| Chilaw Plantation | 33,210,959 | 31,610,959 |
| Loan - Lanka Mineral Sands | 25,000,000 | 25,000,000 |
| Accrued Expenses | 2,903,924 | 1,128,743 |
| EPF - Payable | 235,607 | 175,019 |
| ESPS - Payable | 442,729 | 224,109 |
| CPPS - Payable | 421,371 | 308,723 |
| E.T.F | 123,447 | 98,155 |
| Gratuity Payable | 290,420 | 580,580 |
| Security Deposit - Green Leaf | - | 2,000,000 |
| Other Payables | 11,997,826 | 13,925,917 |
| Credit On Tree Sales | 2,801,000 | - |
| **Total** | **277,029,870** | **263,406,193** |

**b). Trade and other payables for Estates includes the following**

| | As at 31.12.2018 | As at 31.12.2017 |
|---|---|---|
| Sundry Creditors | 48,154,401 | 41,108,917 |
| Elkaduwa Plantation | 172,137 | 172,137 |
| Estates' Current Account | - | 15,571,454 |
| Refundable Tender Deposits | 6,379,570 | 6,379,570 |
| Other Liabilities | 19,646,826 | 17,455,661 |
| Trade Unions | 7,585,493 | 7,122,674 |
| Staff and Workers Payables | 30,758,462 | 40,253,653 |
| Prov. for Audit Fees | 4,789,355 | 4,377,300 |
| E. P. F. Payable | 367,667,260 | 406,651,176 |
| E.S.P.S Payable | 2,817,215 | 990,214 |
| C.P.P.S. Payable | 104,263 | 179,118 |
| E.T.F. Payable | 8,189,921 | 17,600,977 |
| Gratuity Payable | 245,328,735 | 230,175,454 |
| Accrued Expenses | 3,718,286 | 1,962,286 |
| Attendance Bonus Payable | 1,762,706 | 1,849,762 |
| E.P.F Surcharges Payable | 49,970,387 | 48,002,479 |
| E.T.F Surcharges Payable | 292,830 | 2,193,935 |
| Gratuity Surcharges Payable | 7,832,287 | 14,841,411 |
| Other Payables | 6,938,979 | 4,770,480 |
| **Total** | **812,109,113** | **861,658,660** |

AUDITED

### 18 REVENUE

| | 31.12.2018<br>Rs. | 31.12.2017<br>Rs. |
|---|---|---|
| Tea | 211,586,544 | 210,310,097 |
| Green Leaf | 376,969,092 | 432,232,396 |
| Minor Crops | 1,238,100 | 6,835,779 |
| Rubber | 8,156,688 | 13,150,501 |
| **Total Revenue** | **597,950,423** | **662,528,772** |

Tea Sales Includes Income received from sale of refuse tea. Income from Refuse tea, Minor Crops and Trees are shown after deducting the relevant expenditures /Cost of sales.

### 19 OTHER INCOME

| | 31.12.2018<br>Rs. | 31.12.2017<br>Rs. |
|---|---|---|
| Tree Tender | 55,095,950 | 45,396,115 |
| Lease Rentals | 30,448,900 | 25,289,441 |
| Management Fee | 16,189,644 | 15,688,237 |
| Interest Income | 3,197,413 | 4,134,857 |
| Income from Hunnas Water Falls Leisure Park | 3,451,097 | 3,577,444 |
| Other Income - Estates & Head Office | 6,535,510 | 7,913,463 |
| Guest Bungalow Income | 590,328 | 628,800 |
| **Total Other Income** | **115,508,842** | **102,628,358** |

AUDITED

### 20 ADMINISTRATION EXPENSES

| | 31.12.2018<br>Rs. | 31.12.2017<br>Rs. |
|---|---|---|
| Personnel Cost | 41,954,687 | 35,393,501 |
| Defined Contributions - EPF, CPPS & ESPS | 3,149,081 | 2,501,948 |
| Defined Contributions - ETF | 788,778 | 590,875 |
| Depreciation - Head office | 818,234 | 879,479 |
| Gratuity Expense Head office and Estates | 25,853,232 | 27,835,515 |
| Sale Expenses | 3,518,478 | 2,868,920 |
| Other Administration Cost - Estates and Head Office | 52,583,757 | 42,667,097 |
| **Total Administrational Expenses** | **128,666,247** | **112,737,334** |

### 21 FINANCE EXPENSES

| | 31.12.2018<br>Rs. | 31.12.2017<br>Rs. |
|---|---|---|
| Commissions on Cash | 4,694,004 | 4,480,462 |
| Interest on Tea Brokers' Advances | 4,620,075 | 1,547,928 |
| Bank Charges | 50,177 | 40,076 |
| Bank O / D Interest & Cash Commission | 1,126,160 | 205,530 |
| Other Loan Interest - Chilaw Plantation | 1,600,000 | 1,600,000 |
| **Total Finance Expenses** | **12,090,415** | **7,873,996** |

### 22 INCOME TAX

Income tax calculations are not appearing in the annual accounts of SLSPC for the past eighteen years. Due to this reason and with the existence of continuous losses it is presumed that in the future taxable profits may not be available and paying income tax is unlikely by SLSPC. For the past twnenty two years (1995 to 2016) SLSPC has made profits only for four years.

AUDITED

## 23 RELATED PARTY TRANSACTIONS

**Transactions with State and State Controlled Entities**

In the normal course of its operations, the Corporation enters into transactions with related parties. Related parties include the Government of Sri Lanka (State as the ultimate owner of the Corporation),

| | 2018<br>Rs. | 2017<br>Rs. |
|---|---|---|
| **Outstanding Balances:** | | |
| **Payable to** | | |
| State Resources Management Corporation | 28,709,029 | 28,709,029 |
| Fertilizer Corporation | 35,931,679 | 35,931,679 |
| Peoples Bank | - | - |
| Chilaw Plantations | 31,610,959 | 33,210,959 |
| Lanka Mineral Sands Limited | 25,000,000 | 25,000,000 |
| Elkaduwa Plantation | 172,137 | 172,137 |
| Janatha Estates Development Board (JEDB) | 97,709,342 | 97,709,342 |
| Perth estate | 6,985,532 | 6,932,399 |
| | | |
| **Receivable from** | | |
| Elkaduwa Plantation | 1,916,092 | 1,916,092 |
| Janatha Estates Development Board (JEDB) | 41,071,407 | 41,071,407 |
| Janatha Estates Development Board (JEDB) | 1,668,269 | 1,668,269 |

## 24 COMMITMENTS AND CONTINGENCIES

As at date over 516 legal cases have been filed against the SLSPC's Management which includes the cases claiming the unpaid EPF, ETF and Gratuity. The Corporation has been advised by its lawyers that it is only possible, but not probable, that the action will succeed. Accordingly, no provision for any contingent liability has been made in these financial statements. However in the year 2018 too, SLSPC continued to pay part of the statutory Liabilities from the funds received in 2018 from the Treasury

## 25 EVENTS AFTER THE BALANCE SHEET DATE

All the material events after the balance sheet date have been considered and appropriate adjustments and disclosures have been made in to the financial statements, where necessary.

## 26 PRIOR YEAR ADJUSMENTS

Prior year adjustments includes the following transactions relating to the previous financial years and these adjustments were made during this year by the plantations.

| **Details** | **2018**<br>**Rs.** | **2017**<br>**Rs.** |
|---|---|---|
| Salaries Arrears | 641,567 | 17,368,956 |
| EPF/ETF Surcharges | 439,572 | 51,078,837 |
| Gratuity (Surcharges, Under / Over Provision) | - | (348,903) |
| Other Expenditures/Adjustments | - | |
| **Total** | **1,081,138** | **68,098,890** |

AUDITED

මගේ අංකය / எனது இல. / My No. } පිඑල්ඒ/ඒ/එස්එල්එස්පිසී/01/2018/06 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2021 මැයි 19 දින

සභාපති

ශ්‍රී ලංකා රාජ්‍ය වැව්ලි සංස්ථාව

**ශ්‍රී ලංකා රාජ්‍ය වැව්ලි සංස්ථාවේ හි 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1. අභිතකර මතය

ශ්‍රී ලංකා රාජ්‍ය වැව්ලි සංස්ථාවේ හි 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණනය කරන ලදි. සංස්ථාවේ වර්ෂික වාර්තාව සමග ප්‍රසිද්ධ කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සහ 2019 ඔක්තෝබර් 11 දින සංස්ථාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලද ගනුදෙනු පිළිබඳ වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ අභිතකර මතය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් සංස්ථාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 අහිතකර මතය සඳහා පදනම

### 1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම්

(අ) ප්‍රමිත අංක 07 හි 31 ඡේද ප්‍රකාරව පොලී ලැබීම්වලින් වන මුදල් ප්‍රවාහයන් වෙනම, මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ හෙළිකළ යුතු නමුත් සමාලෝචිත වර්ෂයේ මුදලින් ලැබුණු රු.2,853,628 ක පොලී ආදායම වෙනම හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ප්‍රමිත අංක 07 හි 44 ඡේදය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ මුදල් නොවන ගනුදෙනු ඇතුළත් නොකළ යුතු වුවත් විලම්භිත වත්කම් සහ කෙරිගෙන යන වැඩවල සිදුවූ එකතුව රු.683,214 ක අඩු වීම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි.

(ඇ) ප්‍රමිත අංක 13 හි 37 ඡේදය ප්‍රකාරව වර්ෂ 10 කට අධික කාලපරිච්ඡේදයක සිට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු.මි.649 ක් ලෙස පැවත එන සින්නක්කර ඉඩම් සහ සංස්ථාවේ වතු 14 කට අයත් හෙක්ටයාර් 10,917 ක ඉඩම් සාධාරණ අගයට තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) ප්‍රමිත අංක 16 හි 37 ඡේදය ප්‍රකාරව එක සමාන ස්වභාවයක් හා භාවිතයක් පවතින වත්කම් පමණක් කාණ්ඩ කර ගිණුම්ගත කළ යුතු බව දක්වා තිබුණ ද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සංස්ථාවට අයත් වතුයායන්හි පවතින පරිගණක, උපකරණ, ගෘහ භාණ්ඩ හා සවිකිරීම් යන ස්ථාවර වත්කම් වර්ග සියල්ලම උපකරණ, ගෘහ භාණ්ඩ හා සවිකිරීම් යන තනි අයිතමය යටතේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(ඉ) ප්‍රමිත අංක 16 හි 73 (ඇ) ඡේදය ප්‍රකාරව භාවිතා කළ ක්ෂය අනුපාතිකය හෝ ප්‍රයෝජනවත් ජීවිත කාලයන් මූල්‍ය ප්‍රකාශනයන් මඟින් හෙළිදරව් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් ඉඩම් සංවර්ධන පිරිවැය ක්ෂය කිරීමේ දී භාවිතා කරන ලද ක්ෂය අනුපාතය හෙළිදරව් කර නොතිබුණි.

(ඊ) ප්‍රමිත අංක 40 හි 75 (අ) ඡේදය ප්‍රකාරව ආයෝජිත දේපළ මිණුම් කිරීමට භාවිතා කරන ආකෘතිය මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කළ යුතු වුවත්, සංස්ථාවේ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව හෙළිදරව් කර ඇති ආයෝජිත දේපළ පිරිවැය හෝ සාධාරණ වටිනාකම යන ආකෘති දෙකෙන් කුමන ආකෘතිය භාවිතා කර තිබේද යන්න අනාවරණය කර නොතිබුණු අතර, 1992 වර්ෂයේ ප්‍රාදේශීය වතු සමාගම් ශේෂ පත්‍රවල රු.මිලියන

1,611.5 ක් ලෙස දක්වා තිබූ අගයම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ආයෝජිත දේපළ යටතේ දක්වා තිබුණි

(උ) ප්‍රමිත අංක 40 හි 78 (අ) ඡේදය ප්‍රකාරව ආයෝජන දේපළවල විස්තරයක් මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කළ යුතු වුවත්, 1982 පෙබරවාරි 27 දිනැති අංක 181/12 දරන රජයේ ගැසට් පත්‍රය මඟින් සංස්ථාවට ලබා දී ඇති දේපළ පිළිබඳව මූල්‍ය ප්‍රකාශන වලින් හෙළිදරව් කර නොතිබුණි.

(ඌ) ප්‍රමිත අංක 41 හි 4 වන ඡේදය ප්‍රකාරව වන වගාව, පරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් යටතේ ගිණුම්ගත කළ යුතු වුවත්, පිරිවැය රු.24,505,428 ක් වූ වන වගාව ධාරක ජීව විද්‍යාත්මක වත්කම් යටතේ ගිණුම් ගත කර තිබුණි.

(එ) ප්‍රමිත අංක 41 හි 43, 44, හා 45 ඡේද ප්‍රකාරව ජීව විද්‍යාත්මක වත්කම් පරිණත හා පරිණත නොවූ වගාවන් ලෙස වෙන වෙනම පෙන්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම් යටතේ අනාවරණය කර තිබූ රු. 152,272,484 ක ජීව විද්‍යාත්මක වත්කම් එසේ වර්ගීකරණය කර ඉදිරිපත් කර නොතිබුණි.

(ඒ) ප්‍රමිත අංක 41 හි 54 (ඉ) ඡේදය ප්‍රකාරව ධාරක ජීව විද්‍යාත්මක වත්කම් සම්බන්ධයෙන් ප්‍රයෝජනවත් ආයු කාලය හෝ භාවිතා කළ ක්ෂය වීමේ ප්‍රතිශතය මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කළ යුතු වුවත්, සංස්ථාව සතුව ඇති වතුයායන් 17 ක හෙක්ටයාර් 4114 ක තේ වගාව ක්ෂය කිරීම සඳහා භාවිතා කරන ලද ක්ෂය අනුපාතය මූල්‍ය ප්‍රකාශන මඟින් අනාවරණය කර නොතිබුණි.

### 1.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශනවල ගිණුම් සටහන් 3.1.4.2 දරන ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුව සාධාරණ අගයකට පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් අගය කරන බව දක්වා තිබුණද, 2012 වර්ෂයේදී පැවති රු.3,312,160,200 ක ජීව විද්‍යාත්මක වත්කම් හා 2018 වර්ෂයේදී ප්‍රාග්ධනිත කරන ලද රු. 2,420,933 ක ජීව විද්‍යාත්මක වත්කම් සාධාරණ අගයකට තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. තවද, මෙසේ සාධාරණ අගයකට තක්සේරු කර ගිණුම් ගත කරනු වෙනුවට සංස්ථාව සතු වතු 11 ක හෙක්ටයාර් 726.73 ක් පුරා විහිදුනු වන වගාවන් සමාලෝචිත වර්ෂය අවසානයට සියයට 4 කින් එනම් රු.698,603 කින් ක්‍රමක්ෂය කර ගිණුම්ගත කිරීම නිසා සංස්ථාවේ අලාභයද එම වටිනාකමින් අධි ගණනය වී තිබුණි.

### 1.2.3 ගිණුම්කරණ අඩුපාඩු

(අ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ස්ථාවර වත්කම් යටතේ දක්වා ඇති ස්ථාවර වත්කම් වර්ග හතක් සඳහා සමාලෝචිත වර්ෂයේ නිවැරදි ක්ෂය ප්‍රමාණය රු. 6,716,561 ක් විය යුතු වුවද, සංස්ථාවේ ලෙජර ගිණුම් හා නිවැරදිව ගණනය කරන ලද ක්ෂය ප්‍රමාණය අතර රු.428,654 ක වැඩිවීමක් පැවතීම නිසා එම ප්‍රමාණයෙන් අලාභය අධි ගණනය වී තිබුණි.

(ආ) වුඩ්සයිඩ් හා නිකොලොය වතුයායන්වල පිළිවෙලින් රු.10,814,200 ක් හා රු.14,074,561 ක ගෙවිය යුතු පාරිතෝෂික අගයන්,ගෙවිය යුතු පාරිතෝෂික ලෙස හඳුනා නොගැනිම හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් රු.24,888,761 කින් ඌන ගණනය වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට සංස්ථාවේ රු.1,609,054 ක මදුරු කූරු තොගයක් සහ රු.23,381,823 ක් වූ කැලෑ බොක්ක, මිඩ්ලන්ඩ් හා රංගල යන වතු යායන්වල නිමි තේ කිලෝ ග්‍රෑම් 44,639 ක්, වතු යායන් 15 ක පොහොර, රසායනික ද්‍රව්‍ය තොගයක් භෞතිකව සත්‍යාපනය නොකර පොත් අගය පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම නිසා සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵලයෙහි නිවැරදිතාවය පිළිබඳව සෑහිමට පත්විය නොහැකිව තිබුණි.

(ඈ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ ණයගැති ශේෂයට රු.6,644,470 ක පැළ තවාන් වටිනාකමක් ඇතුළත් කර තිබුණි. එම පැළ තවාන් වටිනාකමින් වතු යායන් හයක රු.4,978,340 ක් ලෙස අගය කර තිබූ පැළ තවාන් භෞතිකව නොමැති වීම හෝ යල් පැනීම නිසා ඒවායේ වටිනාකම ශූන්‍ය අගයක් ගෙන තිබුණි.

(ඉ) කම්කරු විනිශ්චයාධිකාර නඩුවකදී 2016 වර්ෂයේ සංස්ථාව ගෙවා තිබූ රු.1,910,225 ක වන්දි මුදල 2016 වර්ෂයේ ජංගම වත්කම් යටතේ තැන්පතු ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි. තවද, 2017 වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ එම මුදල වියදමක් ලෙස දක්වා ජංගම වගකීමක් ලෙස අනාවරණය කර තිබුණි. ඉහත සඳොස් ගිණුම්කරණ සටහන් හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේද එම ශේෂය ජංගම වත්කම් හා ජංගම වගකීම් යටතේ කිසිදු වෙනසක් නොවී එලෙසම පැවතුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුළ වාහන අලුත්වැඩියා කිරීම සඳහා දරන ලද රු.602,039 ක අයහාර වියදම, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් වල වෙළඳ ලැබිය යුතු දෑ ලෙස ඇතුළත් කිරීම හේතුවෙන්, එම වටිනාකමින් ජංගම වත්කම් අධිගණනය වී තිබුණු අතර, අලාභයද එම ප්‍රමාණයෙන් ඌන ගණනය වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල කොටසක් ලෙස ඉදිරිපත් කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශය පහත ගිණුම්කරණ අඩුපාඩු සහිතව පිළියෙල කර තිබුණි.

(i) රු.1,600,000 ක උපචිත පොලී වියදම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අලාභයට සිදුකරන ගැලපීම් යටතේ එකතු කළ යුතු වුවත්, එම වටිනාකම එකතු කිරීමක් ලෙස දක්වා එම ප්‍රමාණයම නැවත අඩු කර දක්වා තිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් තුලින් උත්පාදනය වූ මුදල් ප්‍රවාහය අඩු වී තිබුණි.

(ii) පෙර කාලපරිච්ඡේදයන්ගේ අලාභයට කළ ගැලපීම් ලෙස සමාලෝචිත වර්ෂයේ හඳුනාගත් රු.1,081,138 ක වටිනාකම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට ගැලපීම් කිරීමේ දි රු.1,240,487 ක් ලෙස රු.159,349 කින් අඩුවෙන් ගලපා තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේ මිලදී ගත් රු.235,500 ක පරිගණක මෘදුකාංග සඳහා මුදල් ගෙවා තිබුණේ පසු වර්ෂයේ වුවත්, සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරම් යටතේ දක්වා තිබුණි.

### 1.2.4 නොසැසඳුණු පාලන ගිණුම්

අන්තර් වතු පාලන ගිණුම්වල හර සහ බැර ශේෂයන් අතර රු. 1,930,180 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 1.2.5 පැහැදිලි නොකළ වෙනස්කම්

(අ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම් යටතේ දක්වා ඇති, ධාරක ජීව විද්‍යාත්මක වත්කම් සහ දේපළ පිරියත උපකරණ යන වත්කම්වල, ස්ථාවර වත්කම් ලේඛන සහ අදාළ වත්කම් වල ලෙජර් ගිණුම් අතර, පිළිවෙලින් රු.360,271,689 ක හා රු.174,726,841 ක වෙනස්කම් නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව වෙනත් අතුරු භෝග සඳහා එකතු කර ඇති වටිනාකම රු.591,779 ක් වුවද, වතු ගිණුම් අනුව එම ශේෂය රු.273,637 ක් වූයෙන් මෙම ශේෂ අතර රු.318,142 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 1.2.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) සමාලෝචිත වර්ෂය අවසානයේ සංස්ථාවේ මුළු ණයහිමි ශේෂය රු.1,089,138,983 ක් වූ අතර, එම ශේෂයෙන් රු.543,711,753 ක් හෙවත් සියයට 50 ක් වර්ෂ 4 සිට 14 දක්වා,

කාල පරාසයට අයත් වන අතර, මෙම දිගුකාලීන ණය ශේෂ නිරවුල් කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) 2010 හා 2011 වර්ෂවලට අදාළව ඕපල්ගල වතුයායේ එකතුව රු.786,379 ක ගස් ටෙන්ඩර් තැන්පතු අත්තිකාරම්, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ දක්වා ඇති රු.88,813,279 ක ණයගැති ශේෂය තුල වර්ෂ 04 ත් 14 ත් අතර කාල පරාසයක සිට පැවත එන රු.70,092,898 ක ණය ශේෂ ද, වර්ෂ 15 ඉක්මවා ඇති බිසිසී සමාගමෙන් අයවිය යුතු රු.15,404,568 ක ණය ශේෂයක් ද පැවතුණි. මෙම ණයගැති ශේෂ අයකර ගැනීම සඳහා සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂයේ දී ද ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

(ඈ) 2014 ඔක්තෝබර් 15 දින සංස්ථාව විසින් ගිවිසුමකට එළඹීමකින් තොරව රු.මිලියන 6 ක ණය මුදලක් ඇල්කඩුව වැව්ලි සමාගමට ලබා දී තිබුණු අතර, 2015 වර්ෂයේ සිට මෙම ණය මුදල ගෙවීම පැහැර හැරීම නිසා අය නොවී පවතින ණය ශේෂය රු.1,916,092 ක් විය.

### 1.2.7 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

(අ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු. 1,140,025,407 ක් වූ දේපළ පිරියත හා උපකරණ යටතේ පවතින රු.649,377,817 ක් වූ ඉඩම් වල හා රු. 175,008,452 ක් වූ ගොඩනැගිලි වල අයිතිය තහවුරු කර ගැනීම සඳහා ඔප්පු/බලපත්‍රද, රු.146,868,093 ක් වූ වාහන වල අයිතිය තහවුරු කර ගැනීම සඳහා ලියාපදිංචි සහතිකද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණු රු.3,314,581,133 ක පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් සහ රු.160,864,640 ක ධාරක ජීව විද්‍යාත්මක වත්කම් ශේෂයන් සනාථ කර ගැනිම සඳහා අවශ්‍ය ලේඛන සහ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) 2012 වර්ෂයටත් පෙර සිට පැවත එන රු.1,933,043 ක අක්‍රිය ශේෂයක් සමාලෝචිත වර්ෂයේදී ද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් තුළ අනෙකුත් ගෙවිය යුතු දෑ ලෙස දක්වා තිබුණු අතර, මෙම ශේෂය සනාථ කර ගැනීම සඳහා ලේඛන ගත සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) ප්‍රධාන කාර්යාලයේ හා වතු යායන්වල පිළිවෙලින් රු.103,131,935 ක් හා රු.15,187,725 ක් වශයෙන් එකතුව රු.118,319,660 ක් වූ ණයහිමි ශේෂ සහ එකතුව රු.53,881,380 ක ණය ගැති ශේෂ 09 ක් සඳහා ශේෂ සනාථ සහ පසුකාලින ශේෂ නිරවුල් කිරීම් වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) 2006 වසරේ සිට වතුයායන් 12 කට අයත් රු.6,379,570 ක ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු ලෙස ශේෂයක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් යටතේ සමාලෝචිත වර්ෂයේදී ද පෙන්වා තිබුණු අතර, මෙම ශේෂ සනාථ කර ගැනීම සඳහා ලේඛනගත සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඊ) 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට එකතු කළ අගය මත බදු වශයෙන් රු. 3,486,444 ක මුදලක් ගෙවිය යුතුව තිබුණු අතර, එකතු කළ අගය බද්දෙන් නිදහස් බවට සංස්ථාව දරන මතය සනාථ කර ගැනීම සඳහා ලේඛනගත සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(උ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ අනාවරණය කර ඇති රු.50,220,922 ක ණයගැති ශේෂ සනාථ කර ගැනීම සඳහා අවශ්‍ය ලේඛනගත සාක්ෂි සංස්ථාව සතුව නොතිබුණි.

(ඌ) 2012 වර්ෂයටත් පෙර සිට පැවත එන සමාලෝචිත වර්ෂයේද මූල්‍ය තත්ව ප්‍රකාශනයේ ණයගැති ශේෂයෙන් අඩු කර පෙන්වා ඇති රු. 47,537,070 ක විශේෂ හානිකරණය සඳහා වෙන් කිරීම් සහ රු. 1,591,349 ක අඩමාණ ණය වෙන්කිරීම් සඳහා භාවිතා කල පදනම පැහැදිලි කර නොතිබීම නිසා එහි නිරවද්‍යතාවය පරීක්ෂා කිරීමට නොහැකි විය.

(එ) පසුගිය වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.73,683,136 ක් වටිනා ගොඩනැගිලි , වාහන සහ යන්ත්‍රසූත්‍ර වැනි ස්ථාවර වත්කම් සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් ලේඛනයෙන් ඉවත් කර තිබුණු අතර මේ සඳහා හේතු වූ කරුණු එහි සඳහන් කර නොතිබුණි.

(ඒ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දේපළ පිරියත හා උපකරණ යටතේ දක්වා ඇති රු.1,645,340 ක වන කළමණාකරනය වියදම තහවුරු කිරීම සඳහා අවශ්‍ය ලේඛනගත සාක්ෂි කිසිවක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය හා 12 වන වගන්තිය පරිදි පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

2.1.1. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ අහිතකර මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංස්ථාව පවත්වාගෙන ගොස් නොතිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද 2.2.1 (ආ) i, ii, iii, iv, 2.2.1 (ඇ) ,2.2.1 (ඈ) ,2.2.2 (ආ) සහ 2.2.2 (ඇ) යන නිර්දේශයන් හැර , අනෙකුත් නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2. අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සංස්ථාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සංස්ථාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති / විධානයට යොමුව | විස්තරය |
| --- | --- |
| (අ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 15 වන වගන්තිය හා 1980 අංක 46 දරන සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල් පනතේ ii කොටසේ 16(i) වගන්තිය | 2006 වර්ෂයේ සිට රු.367,667,260 ක් වූ සේවක අර්ථසාධක අරමුදල් වගකීම්ද, රු.8,189,921 ක සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල් වගකීම්ද, සමාලෝචිත වර්ෂය අවසන් දින දක්වා ගෙවීමට කටයුතු කර නොතිබුණු අතර, මේ නිසා සංස්ථාවට එකතුව රු.50,263,217 ක අධිභාර පනවා තිබුණි. |
| (ආ) 2003 ජුනි 02 දිනැති අංක 12 දරන පොදු ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය | මූල්‍ය වර්ෂයක් අවසාන වී දින 60 ක් ඇතුළත අස්ථිත්වයට අදාළ වාර්ෂික ගිණුම් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ ගිණුම් විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2020 ජුනි 29 දින වන අතර, ඒ වන විට ගිණුම් ඉදිරිපත් කළ යුතු කාලය වර්ෂ 1 ½ කින් ඉක්ම ගොස් තිබුණි. |
| (ඇ) 2009 නොවැම්බර් 13 දිනැති අංක 438 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 02 ඡේදය | සංස්ථාව සතු තේ කර්මාන්තශාලා 07 ක් වර්ෂ 5 සිට වර්ෂ 40 කට අධික කාලයක සිට භාවිතයට ගෙන නොතිබුණු අතර, මෙම වසා දමා ඇති කර්මාන්තශාලාවන්හි පවතින ගොඩනැගිලි, යන්ත්‍රසූත්‍ර, මෙවලම් හා උපකරණ එම වසා දමා ඇති කාලපරිච්ඡේදය තුළම භාවිතයෙන් ඉවත් කර ඇතත් එම වත්කම් අපහරණය කිරීමට හෝ සංස්ථාවට වඩා ලාභදායි ආයෝජන ක්‍රියාවකට යෙදවීමට කටයුතු කර නොතිබුණි. |
| (ඈ) 2018 මාර්තු 19 දිනැති අංක 01/2018 දරන වත්කම් කළමණාකරන චක්‍රලේඛයේ 2 (අ) ඡේදය සහ අංක 02/2015 2015 ජුලි 10 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 02 ඡේදය | සංස්ථාව සතු භාවිතයෙන් ඉවත් කළ ලොරි රථ 13 ක්, ට්‍රැක්ටර් හා ට්‍රේලර් 25 ක්, කාර් රථ 07 ක්, ජීප් රථ 03 ක් , ගිලන් රථ 04 ක් , ත්‍රීවිල් රථ 01 ක් හා මෝටර් බයිසිකල් 43 ක් 2020 දෙසැම්බර් 31 දින වන විටත් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 ( උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව සංස්ථාවේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සංස්ථාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

**2.2.4.1 ප්‍රසම්පාදනය සහ කොන්ත්‍රාත් ක්‍රියාවලිය**

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 (අ) ප්‍රකාරව සංස්ථාව විසින් 2018 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) රු. 1,398,000 ක වියදමක් දරා වතුයායන් සඳහා පැතලි මල නොකන වානේ මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 5.3.11.(අ) ප්‍රකාරව ලංසුකරුගෙන් ලංසු සුරක්ෂණයක් ලබාගෙන නොතිබුණු අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 8.9.1 පරිදි ප්‍රතිග්‍රහණ ලිපියක් සැපයුම්කරු වෙත නිකුත් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී රු. 840,000 ක වියදමින් මදුරු කූරු ඇසුරුම් කවර 200,000 ක් මිලදී ගෙන තිබුණු අතර, ලංසු ලබා ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 6.3.1(අ) ප්‍රකාරව ටෙන්ඩර් පෙට්ටියක් තුළට හෝ ලියාපදිංචි තැපැලෙන් ලබා නොගෙන ඊ-මේල් මගින් ලබා ගෙන තිබුණි. තවද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 7.4.1 පරිදි කටයුතු නොකර ලංසු විවෘත කිරීම සහ ඇගයීම් කටයුතු දින 100 කින් ප්‍රමාද කර තිබුණි.

(ඇ) රු .1,950,000 ක වියදමින් ප්‍රධාන කාර්යාලයෙහි බිම් මහළ හා පළමු මහළෙහි කොටස් බෙදා වෙන් කර තිබුණු අතර, ප්‍රසම්පාන මාර්ගෝපදේශ 6.2.2 පරිදි ලංසු ලබා දීමේ අවම කාල සීමාව ලංසුකරුවන්ට ලබා දී නොතිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.8.1 (ආ) පරිදි තාක්ෂණික ඇගයීම් කමිටුවට විෂය පිළිබඳ විශේෂඥයෙකු සහභාගි වී නොතිබුණු අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශය 8.9.1 පරිදි කොන්ත්‍රාත්කරු වෙත විධිමත් ප්‍රතිග්‍රහණ ලිපියක් නිකුත් කර නොතිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 8.9.1 (අ) ප්‍රකාරව ලිඛිත ගිවිසුමක් අත්සන් කර නොතිබුණු අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 8.12.2 පරිදි වැඩ අවසන් කිරීමේ

ලිපියක් (Completion Report) ලබා නොගෙන කොන්ත්‍රාත්කරුට රු.250,000 ක අවසන් ගෙවීමද කර තිබුණි.

ඩබ්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති